

## ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

**දිවයින පුරා ශාඛා 272 ක ජාලයකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ප්‍රතිඵල අභිමුඛ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# ප්‍රධාන කළමනාකරු - භාණ්ඩාගාර

### අවශ්‍ය මූලික සුදුසුකම්

1. අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තිමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
    a. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL)
    b. සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA)
    c. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA)
    d. වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (CFA)

(පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ බැංකුකරණය පිළිබඳ වෘත්තිය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.)

2. අවම වශයෙන් වසර 02 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 15 ක අවම පළපුරුද්දක් ලබා තිබීම සහ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 08 ක අවම පළපුරුද්දක් ලබා තිබීම.
3. වයස අවු. 50 ට අඩු වීම.

### සේවා කොන්දේසි :

මූලිකව වසර 01 ක පරිවාස කාලයකට යටත්ව පත් කිරීම සිදුකරනු ලැබේ. බැංකුව සෑහීමකට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලමින් පරිවාස කාලය සාර්ථකව නිමකරන, අයදුම්කරු ස්ථිර කාර්ය මණ්ඩලය වෙත බඳවා ගැනීම සඳහා සලකා බැලේ.

### ප්‍රතිලාභ :

සුදුසුම අපේක්ෂකයා සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජයක් සපයනු ලැබේ.

### අයදුම් කළ යුතු අවසන් දිනය :

**2025 දෙසැම්බර් මස 09 වනදා**

### අයදුම් කළයුතු ආකාරය

තමා පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත ඉහත අයදුම් කළ යුතු අවසන් දින හෝ ඊට පෙර **careers@rdb.lk** ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය. එහි විෂය (Subject) තීරයේ අයදුම් කරනු ලබන අදාළ තනතුර සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

RDB
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk